# අරගලය
# පිළිබඳ සමීක්ෂණය



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
සෝෂල් ඉන්ඩිකේටර්
2022 සැප්තැම්බර්

# හැඳින්වීම

මෙම පර්යේෂණ වාර්තාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රජයට එරෙහි ජනතා නැගිටීම (අරගලය) සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයේ සොයාගැනීම් ඉදිරිපත් කරයි. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ, ඉන්ධන, ගෑස් වැනි දැඩි හිඟතාවයන්, දැවැන්ත මහජන පීඩාවන් මධ්‍යයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වෙන ලෙසත්, ශ්‍රී ලංකාවේ දේශපාලනයෙන් රාජපක්ෂ පවුලේ භූමිකාව අවසන් කරන ලෙසත් ඉල්ලා ආණ්ඩුවට එරෙහිව මහජනතාව එක්වී අරගලයේ නිරත විය. දූෂණය සහ වැරදි කළමනාකරණය හෙළා දකිමින්, සිය දහස් ගණනින් මහජන රැලිවලට එක් වූ ජනතාව බලයේ සිටින අයට වග වන ලෙස බලපෑම් කරන ලදී. උග්‍ර වන විරෝධතා මධ්‍යයේ, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජූලි 09 වැනිදා රටින් පලා ගිය අතර ජූලි 14 වැනිදා සිය ඉල්ලා අස්වීම භාර දෙන ලදී. ජූලි 20 වැනිදා ජනාධිපති ධූරය සඳහා රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කර ගන්නා ලදී. නව ජනාධිපතිවරයා ලෙස වික්‍රමසිංහ, විරෝධතාකරුවන් බිය ගැන්වීමට/ සලිත කිරීමට ලක්කිරීමට සහ හිරිහැර කිරීමට ආරක්ෂක හමුදා සහ පොලිසිය යෙදවීම මඟින් රටේ දේශපාලන පැළැන්තිවලට එරෙහි අඛණ්ඩ මහජන විරෝධය මර්දනය කිරීමට කටයුතු කරන ලදී. මෙවැනි රාජ්‍ය මර්දන පසුබිමක, ජනතා විරෝධයට මහජන සහභාගීත්වය ක්‍රමයෙන් අඩු විය. එසේ විරෝධතාවන්හි අඩු වීමක් පැවැතිය ද, දූෂිත දේශපාලන පැළැන්ති සහ විශේෂයෙන් ජනාධිපති වික්‍රමසිංහට එරෙහි විරෝධතා දිගටම පැවැතිනි. විරෝධතාකරුවන්ට අනුව ජනාධිපති වික්‍රමසිංහට ජනවරමක් නොමැතිය යන මතයේ ඔවුන් දැඩිව සිටින ලදී. විරෝධතාකරුවන් සහ විරෝධතා ව්‍යාපාරය කෙරෙහි දක්වන මහජන මතය, ආකල්ප තේරුම් ගැනීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් දිස්ත්‍රික්ක 25හිම ජීවත්වන අහඹු ලෙස තෝරාගත් පුරුෂයින් සහ ස්ත්‍රීන් 1000ක් අතර සමීක්ෂණය පවත්වන ලදී.

ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, මුදිතා පතිරණ සහ ඉෂාරා ජයරත්න යන අයගෙන් මෙම සමීක්ෂණ කණ්ඩායම සමන්විත විය. සෝෂල් ඉන්ඩිකේටර්, මෙම අධ්‍යයනට දැක්වූ සහාය සඳහා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට, භවානි ෆොන්සේකාට සහ මෙම කටයුත්ත සිදුකිරීම උදෙසා අරමුදල් ලබා දුන් සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ ගෝලීය වැඩසටහන - Global Initiative for Justice Truth and Reconciliation (GIJTR) සංවිධානයට ස්තුතිවන්ත වෙමු. මෙහි කවරයේ ඡායාරූප මාත්‍රම්හි (https://maatram.org/) කතෘ සෙල්වරාජා රාජසේගර් විසින් ඡායාරූපගත කරන ලද්දකි.

# ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) නියැදි ප්‍රතිචාර දැක්වූවන් 1000 ගෙන් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කර සිදු කරන ලදී. නියැදිය නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ දෙකෙහිම ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් සමන්විත විය. ප්‍රතිචාර දැක්වූවන් තෝරාගැනීමට අහඹු නියැදීමේ ක්‍රමවේදය භාවිතා කර ඇති අතර, නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහුඅදියර අහඹු ස්ථරීකරණ නියැදි තාක්ෂණය භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 සැප්තැම්බර් 22 දින සිට ඔක්තෝම්බර් 10 දක්වා පවත්වන ලදී. ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජ විද්‍යාව සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

## අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳ මතය

- රජය අයවැය ප්‍රතිපාදන වෙන් කළ යුතු යැයි මහජනතාව සිතන ක්ෂේත්‍ර ශ්‍රේණිගත කරන ලෙස විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගේ 30% කගේ පළමු ප්‍රමුඛතාවය කෘෂිකාර්මික අංශයයි.
- 29%ක් අධ්‍යාපන ක්ෂේත්‍රය තම පළමු ප්‍රමුඛතාවය ලෙස ශ්‍රේණිගත කරද්දී, 18%ක් අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන සැලසීමට ප්‍රමුඛත්වය දිය යුතුයි යන මතයේ සිටිති.
- අධ්‍යාපන ක්ෂේත්‍රය පළමු ප්‍රමුඛතාවය ලෙස ශ්‍රේණිගත කරන්නේ බොහෝ දුරට තරුණ තරුණියන් (අවුරුදු 18-29) වන අතර වයස අවුරුදු තිහ සහ ඊට වැඩි වයස් කාණ්ඩයේ පුද්ගලයින් කෘෂිකාර්මික අංශය පළමු ප්‍රමුඛතාවය ලෙස ශ්‍රේණිගත කරයි.
- ප්‍රාදේශීය වශයෙන් සසඳන විට, ප්‍රාදේශිය සභාවන්හි වැඩි පිරිසක් (33%) කෘෂිකාර්මික අංශය පළමු ප්‍රමුඛතාවය ලෙස ශ්‍රේණිගත කරයි.

## ආදායම් සහ වියදම්

- ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (81%) තම ආදායමෙන් තම අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි බවත්, තමන්ට දුෂ්කරතා ඇති බවත් ප්‍රකාශ කරයි. ඔවුන්ගෙන් 46% ක් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දෙති.
- වැඩි වශයෙන් දුෂ්කරතා අත්විඳින්නේ මහ නගර සභා ප්‍රදේශවලින් පිටත ජනතාවයි.

## රටේ ආර්ථිකය යථා තත්වයට පත්වීම පිළිබඳ මතය

- සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් අවිශ්වාසයක් දක්වයි. රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට බොහෝ කාලයක් ගතවනු ඇතැයි සැලකිය යුතු ප්‍රතිශතයකගේ (63%) අදහස වන අතර 20% ක් ඔවුන්ට අවිශ්වාස බව දක්වයි. මෙම මතය වයස හෝ ප්‍රදේශය අනුව වෙනස් නොවේ.

## අරගලයට නායකත්වය දුන් /සහභාගී වූ තරුණ තරුණියන් පිළිබඳ මතය

- අරගලයට නායකත්වය දුන්/ සහභාගී වූ තරුණ තරුණියන් පිළිබඳ මහජන මතය සහ ඔවුන්ට එල්ල වී ඇති චෝදනා පිළිබඳව ද සමීක්ෂණය මගින් විමර්ශනය කරන ලදී. පර්යේෂණ සොයාගැනීම්වලින් පෙනී යන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් එම තරුණ තරුණියන් පිළිබඳව සුබවාදී අදහස් දරන අතර අඩු විවේචනයක් ඇති බවයි.

- ශ්‍රී ලාංකිකයින්ගෙන් 82% ක් අරගලය සක්‍රීය පුරවැසියන් ලෙස ක්‍රියා කරන තරුණ තරුණියන් විසින් රට වඩා හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක් කරා ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් මෙහෙයවන ලද බව විශ්වාස කරයි. එයට සමාන ප්‍රතිශතයක් සඳහන් කරන්නේ තරුණ තරුණියන් විරෝධතා දැක්වූයේ රටේ යහපත් අනාගතය පිළිබඳ පොදු අරමුණක් උදෙසා උනන්දුවකින් බවයි.
- සාපේක්ෂ වශයෙන්, වයස අවුරුදු 30 ට වැඩි පුද්ගලයින් හා සසඳන විට අවුරුදු 18-29 අතර තරුණ තරුණියන් අරගලයට නායකත්වය දුන් / සහභාගී වූ තරුණ තරුණියන් කෙරෙහි වඩාත් සුබවාදී වේ.
- අරගලයට සහභාගී වූ තරුණ තරුණියන් පිළිබඳ ධනාත්මක අදහස් සෑම ප්‍රදේශයකම දක්නට ලැබේ.

## අරගලය පිළිබඳ ආකල්ප

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (82%) අරගලය අපේ රටට යහපත් බලපෑමක් ඇති කළ බව විශ්වාස කරන අතර එයට සමාන ප්‍රතිශතයක් (81%) විශ්වාස කරන්නේ අරගලය ඒ මොහොතේ අවශ්‍යතාවයක් බවයි. විරෝධතාකරුවන් නීතිය උල්ලංඝණය කර ඇත්නම් නීතිමය පියවර ගත යුතු බවට 60% කට ආසන්න පිරිසක් එකඟ වෙති.
- අනෙක් අය සමඟ සසඳන විට, තරුණ තරුණියන් (අවුරුදු 18-29) අරගලය සහ එයට නායකත්වය දුන් තරුණ තරුණියන් කෙරෙහි වඩාත් සුබවාදී ආකල්ප දරන බව පෙනේ. ප්‍රදේශය අනුව බලන විට, නගර සභා ප්‍රදේශයන්හි වෙසෙන ජනතාව අතර අරගලයට ඇති සහයෝගය වැඩි බව පෙන්නුම් කරයි.

## රට පාලනය කරන විදියේ ඇති විය හැකි වෙනසක් පිළිබඳ අදහස

- ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (83%) රට පාලනය කරන විදියේ වෙනසක් සඳහා සිය සහය පළ කරති. මෙම අදහස ප්‍රාදේශීයත්වය හෝ වයස අනුව වෙනස් නොවේ.

## රට පාලනය කරන විදියේ වෙනසක් සඳහා කැපකිරීම් කිරීමට ඇති කැමැත්ත

- ප්‍රතිචාරකයන්ගෙන් රට පාලනය කරන විදියේ වෙනසක් සඳහා කැපකිරීම් කිරීමට එකඟ වන්නේ ද යන්න සඳහන් කරන ලෙස ඉල්ලා සිටින ලදී. සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, රට පාලනය කරන විදියේ වෙනසක් සඳහා වන කැපකිරීම් දැඩි වන විට මහජන සහය අඩු වේ. සැලකිය යුතු ප්‍රතිශතයක් (76%) ප්‍රකාශ කරන්නේ ඔවුන් තම සුපුරුදු ගමන් බිමන් හෝ ප්‍රවාහන ක්‍රමයේ කැපකිරීම් කිරීමට සිදුවුවත් රට පාලනය කරන විදියේ වෙනසකට සහය දීමට එකඟ වන බවයි. 70% ක් ප්‍රකාශ කරන්නේ රට පාලනය කරන විදියේ වෙනසක් සඳහා ඔවුන් මිලදී ගැනීමට හුරු වී සිටින ආහාර ද්‍රව්‍යවලින් කැප කිරීමක් කිරීමට එකඟ වන බවයි. ඔවුන්ට වැඩිපුර බදු ගෙවීමට සිදුවුවහොත් (40%) මෙම සහය විශාල වශයෙන් අඩු වේ. ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකකට (26%) තරමක්

වැඩි ප්‍රමාණයක් ඔවුන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට රැකියාවක් අහිමි වුවද රට පාලනය කරන විදියේ වෙනසක් කිරීමට සහාය දීමට එකඟ වේ. ප්‍රතිචාරකයන්ගේ වයස අනුව මෙම ආකල්ප වෙනස් නොවේ. කෙසේ වෙතත්, මෙම කැපකිරීම් පිළිබඳව ප්‍රාදේශීයව විවිධ අදහස් පවතී.

## පෞද්ගලීකරණය පිළිබඳ මතය

- අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන ප්‍රධාන අංශ දෙක පෞද්ගලීකරණය කිරීම පිළිබඳ මහජන මතය ද මෙම සමීක්ෂණයෙන් විමසා ඇත. එම සොයාගැනීම්වලට අනුව, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වැඩි පිරිසක් මෙම අංශ දෙක පෞද්ගලීකරණය කිරීමේ යෝජනාවට විරුද්ධ වේ. කෙසේ වෙතත්, අධ්‍යාපන ක්ෂේත්‍රය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පෞද්ගලීකරණය කළ යුතු බවට දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකක් එකඟ වෙති. මෙම අදහස් රටාව සියලුම ප්‍රදේශයන්හි සහ වයස් කාණ්ඩවල පැතිරී ඇතත්, තරුණ තරුණියන් අතර පෞද්ගලීකරණය සඳහා තරමක් ඉහළ සහයෝගයක් පවතී.

## ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණය පිළිබඳ මතය

- සැලකිය යුතු බහුතරයක් තම මතය ලෙස ප්‍රකාශ කරන්නේ වෙනත් ඕනෑම පාලනයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදය (79%) සුදුසු බවයි. මෙම මතය වයස අනුව වෙනස් නොවේ.

## බලය බෙදාහැරීම පිළිබඳ මතය

- මෙම සමීක්ෂණයේ සොයාගැනීම්වලට අනුව, මධ්‍යම ආණ්ඩුවේ බලය අඩුකරන අතරතුර පළාත් සභාවලට බලය බෙදිය යුතු බව ශ්‍රී ලාංකිකයන්ගෙන් 39%ක් ප්‍රකාශ කරති. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකිකයන්ගෙන් 30%කගේ මතය වන්නේ ඇතැම් බලතල විමධ්‍යගත කිරීම ගැළුවක් නැති නමුත් මධ්‍යම ආණ්ඩුවේ බලතල අඩු නොකළ යුතු බවයි. බොහෝ විට වයස අවුරුදු තිහට අඩු (42%) තරුණ තරුණියන් පළාත් සභාවලට බලය බෙදිය යුතු බවත් මධ්‍යම ආණ්ඩුවේ බලය අඩු විය යුතු බවත් යන මතයේ සිටීම විශේෂිත කරුණකි.

## ජනවාර්ගික සබඳතා

- සෑම පුරවැසියෙකුගේම සමානාත්මතාවය සඳහා ඇති අයිතිය පවත්වා ගැනීම සඳහා කිසිදු ආගමකට ප්‍රමුඛස්ථානය නොදිය යුතු බව ශ්‍රී ලාංකිකයන්ගෙන් 54% ක් ප්‍රකාශ කරයි. 45%ක් ප්‍රකාශ කරන්නේ වසර 30ක යුද්ධයෙන් මියගිය අය සිහිපත් කිරීමට සියලු ජාතීන්ට නිදහස ලබාදිය යුතු බවයි. වයස් කාණ්ඩ අනුව සසඳන විට තරුණ තරුණියන්ගෙන් තරමක් වැඩි ප්‍රතිශතයක් විශ්වාස කරන්නේ කිසිම ආගමකට ප්‍රමුඛස්ථානය නොදිය යුතු බවත් තිස් වසරක යුද්ධයෙන් මියගිය අය සිහිපත් කිරීමට සියලු ජනවර්ගවලට නිදහස ලබාදිය යුතු බවත්ය.

## පාලන ක්‍රම පිළිබඳ මතය

- ප්‍රතිචාරකයන්ට රටක් පාලනය කළ හැකි විවිධ ක්‍රම සපයා ඒ අතරින් ඔවුන් සහය දක්වන්නේ කුමන ආකාරයේ පාලන ක්‍රමයටදැයි ප්‍රකාශ කරන ලෙස විමසන ලදී. ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයකගේ (89%) අදහස වන්නේ නිදහස් හා සාධාරණ මැතිවරණයකින් ජනතාව විසින් තෝරා ගන්නා ලද අය රට පාලනය කළ යුතු බවයි. අවම ප්‍රියතාවයක් ඇති පාලන ක්‍රම වන්නේ රට සම්බන්ධයෙන් ප්‍රධාන තීරණ සියල්ලම ගත යුත්තේ දේශපාලකයන්ට වඩා ආගමික නායකයන් විසින් යන්නට සහ රට පාලනය කිරීම සඳහා හමුදාව ඉදිරිපත් විය යුතුය යන්නටය. මෙම අදහස් රටාව වයස් කාණ්ඩ දෙකම (අවුරුදු 30ට වැඩි සහ අඩු) අතර දක්නට ලැබේ.

## ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ආකල්පය

- විදේශ සමාගම්වලට රට තුළ ආයෝජනය කිරීමට රජය ඉඩ දිය යුතු බව 60%කගේ මතය බව සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි. 63%ක් ප්‍රකාශ කරන්නේ රජය විසින් පුද්ගලයකුගේ ආදායම් ඉපැයීමේ හැකියාව සීමා නොකළ යුතු බවත් 52%කගේ මතය වන්නේ රටේ සංවර්ධනයට අවශ්‍ය බැවින් රජයේ සංස්ථා පෞද්ගලීකරණය නොකළ යුතු බවත් ය. විදේශීය සමාගම්වලට රට තුළ ආයෝජනය කිරීමට රජය ඉඩ දිය යුතුය යන්නට පක්ෂව සිටින අය අතරින් වැඩිපුරම සිටින්නේ තරුණ තරුණියන්ය (65%).

## සුබසාධන ප්‍රතිපත්ති පිළිබඳ අදහස

- සුබසාධන ප්‍රතිපත්ති ප්‍රශ්නය සම්බන්ධයෙන් ජනතාව විවිධ අදහස් ප්‍රකාශ කරති. බහුතරයක් රාජ්‍ය සේවකයන් අඩු කිරීමට (51%) සහාය දෙන අතර, ජනතාව තවමත් අපේක්ෂා කරන්නේ රජය තම ජනතාව ගැන සොයා බැලීම සහ සුබසාධන වැඩසටහන් සඳහා වියදම් කිරීමේ වගකීම භාරගත යුතු බවයි (49%). තවද, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් ප්‍රකාශ කරන්නේ රැකියාවක් සොයා ගැනීම ඒ ඒ පුද්ගලයාගේ වගකීමක් බවයි.
- රාජ්‍ය සේවක සංඛ්‍යාව අඩු කළ යුතු යැයි විශ්වාස කරන අය අතරින් වැඩි පිරිසක් තරුණ තරුණියන් (53%) වේ. ඊට වෙනස්ව, අවුරුදු තිහට වැඩි පුද්ගලයින්ගෙන් 52% ක් තම ජනතාව රැකබලා ගැනීම රජයේ වගකීමක් යන අදහස දරනු ලබයි. වයස් කාණ්ඩ දෙකෙන්ම දළ වශයෙන් 50%ක් විශ්වාස කරන්නේ රැකියාවක් සොයා ගැනීම ඒ ඒ පුද්ගලයාගේ වගකීමක් බවයි.

යුක්තිය, සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ ගෝලීය වැඩසටහන (GIJTR) මඟින් ගෝලීය සංවිධාන නවයක නියෝජනයෙන් මනෝ-සමාජ සහයෝගයෙහි සිට අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ නීතිය පිළිබඳ ලේඛන දක්වා වූ පරාසයක විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම ඇති උපදේශකයින්, ක්‍රියාකාරීන් සහ වෘත්තිකයන් ඒකරාශී කරනු ලබයි. යුක්තිසහගත හා සාමකාමී අනාගතයක් නිර්මාණය කිරීමේදී ඔවුන් සැම එක්ව ගැටුම්කාරී පසුබිම්හි වෙසෙන ප්‍රජාවන්ට උපකාර කරනු ලබයි.

GIJTR
Global Initiative for Justice, Truth & Reconciliation

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනයඃ නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 208134/ +94 11 208135/ +94 11 208136
වෙබ්ඃ www.cpalanka.org
ෆේස්බුක් - https://www.facebook.com/CPASL/
ට්විටර් - https://twitter.com/CPASL

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

25 YEARS
1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනයඃ නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 2584050
වෙබ්ඃ www.cpalanka.org.survey-research
විද්‍යුත් තැපැල - krishna@cpasocialindicator.org

Making Social Research Count